මාධ්‍ය නිවේදනය

# ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයාගේ ධූර කාලය අවසන් වනවිට නැවත නඩු දැමීමට වින්දිතයෝ සැලසුම් කරති

**2019 දෙසැම්බර් 04**

**ජොහැන්නස්බර්ග්, දකුණු අප්‍රිකාව:** වධහිංසා පැමිණවීම සම්බන්ධයෙන් ගෝඨාභය රාජපක්ෂගෙන් වන්දි ඉල්ලා ඇමරිකා එක්සත් ජනපදයේ පවරා ඇති නඩුව ඔහු ජනාධිපති පදවියේ ඉන්නා කාලසීමාව තුලදී ඉවත් කරගැනීමට එම නඩුව පැවරූ වින්දිතයන් එකොලොස් දෙනා උපාය මාර්ගික තීන්දුවක් ගෙන තිබේ. ඒ ජනාධිපති වශයෙන් සිටියදී නඩු පැවරීමෙන් මුක්තිය ලබාගැනීමේ ඉඩකඩ ගෝඨාභය රාජපක්ෂට අහුරා ලීමටය. ඔහු ධූරය හැර ගිය පසු නඩුව නැවත පැවරීමට වින්දිතයන් සතු අයිතිය ඒ මගින් ආරක්ෂා කෙරේ.

*"ගෝඨාභය අද දැලෙන් ගැලවී ගියත්, ඔහු ජනාධිපති ලෙස ජීවිතය තිබෙන තුරු නොසිටිනු ඇති අතර, එක දවසක ඔහුටත්, ඔහුට ආධාර අනුබල දුන් අයටත් වගඋත්තර බැඳීමට සිදුවනු ඇත," යි සත්‍යය සහ යුක්තිය සඳහා වන ජාත්‍යන්තර ව්‍යාපෘතියේ (ITJP) විධායක අධ්‍යක්ෂිකා යැස්මින් සූකා පැවසුවාය. "මේ ප්‍රමාදයෙන් සිදුවන්නේ යුක්තිය ඉටුවීම සඳහා වින්දිතයන්ට තවත් කාලයක් බලා හිඳින්නට සිදුවීමයි. ගෝඨාභයගේ ධූර කාලය අවසන් වූ යම් දවසක යුක්තිය ඉටු කර ගැනීමට හැකි වෙතැයි යන හැඟීම තමන්ට ශක්තියක් ලබා දෙන බව වින්දිතයන් පවසා තිබේ."*

ජාත්‍යන්තර නීතිඥ ආයතනයක් වන හවුස්ෆෙල්ඩ් සමාගම හා එක්ව ITJP විසින් එක්සත් ජනපදයේ, මධ්‍යම කැලිෆෝනියා දිසා අධිකරණයේ 2019 අප්‍රේල් මාසයේ සිවිල් වන්දි නඩුවක් ගොනු කරන ලද්දේ වධහිංසාවට ගොදුරු වී දිවි ගලවා ගත් දෙමළ ජාතික රෝයි සමාදනම් වෙනුවෙනි[1]. එම පැමිණිල්ල 2019 ජුනි 26 ද තවත් පුළුල් කරන ලද්දේ දෙමළ අටදෙනකු සහ සිංහල දෙදෙනකු එකතු කර ගනිමිනි. ආරක්ෂාව සහතික කරනු පිණිස ඔවුන් නිර්නාමිකව තබන ලදී[2]. නඩු පවරන ලද්දේ වධහිංසාවට ගොදුරු වූවන්ට එක්සත් ජනපද අධිකරණයේ සහන සලසා දෙන වධ වින්දිතයන් ආරක්ෂා කිරීමේ පනත යටතේය. ඒ වනවිට එක්සත් ජනපද - ශ්‍රී ලාංකික ද්විත්ව පුරවැසියකු වූ රාජපක්ෂ මහතාට 2019 අප්‍රේල් 7 ද නොතීසි භාර දෙන ලද්දේ කැලිෆෝනියාවේ, ග්ලෙන්ඩේල් හි "ට්‍රේඩර් ජෝ" වෙළෙඳසලේ වාහන නැවතුම්පලේදී ය.

---

[1] http://www.itjpsl.com/assets/press/Samathanam-complaint_file_stamped.pdf

[2] http://www.itjpsl.com/assets/press/ECF-No.-0066-Plffs-Motion-to-Proceed-Anonymously.pdf

*"කුරිරු අපයෝජන සම්බන්ධයෙන් රාජපක්ෂ මහතා වගකිව යුතු බව තහවුරු කෙරෙන බරපතල සාක්ෂි අපේ සේවාදායකයන් විසින් ඉදිරිපත් කරන ලද අතර, අවසානයේදී ඔහුට මෙම අපරාධ සම්බන්ධයෙන් ජාත්‍යන්තර නීතිය යටතේ උත්තර බඳින්නට සිදුවනු ඇත,"* යි හවුස්ෆෙල්ඩ් සමාගමේ මානව හිමිකම් නීතිඥ ස්කොට් ගිල්මෝර් පැවසීය. *"රාජපක්ෂ මහතා දැන් ජනාධිපති වී සිටි පමණින් වින්දිතයන් විසින් ඔහු අනාගතයේදී වගඋත්තරකාරීත්වයෙන් බැඳ ලීම වැළකී යන්නේ නැත."*

රාජපක්ෂ මහතාගේ පාලනය යටතේ තිබූ පොලිස් ස්ථාන සහ හමුදා කඳවුරු වල දී තමන් අත්විඳි භයංකර වදවේදනා වින්දිතයන් විසින් අධිකරණ ලියවිලි වල විස්තර කර තිබේ. ස්ත්‍රීන් සහ පුරුෂයන් ගිනියම් යකඩ පොලු වලින් හංවඩු ගසා, කේබල් වලින් කස පහර දී, පෙට්‍රල් දැමූ ප්ලාස්ටික් බෑග් ඔලුවේ දමා හුස්ම හිරකොට තිබේ. ඒ අතරින් හය දෙනකු දිගින් දිගටම දූෂණය කොට ලිංගික ප්‍රහාරයට ලක් කොට තිබේ[3]. සිවිල් යුද්ධය අවසන් වූ 2009 න් පසු අවුරුදු තුනක්ම තමන් ලිංගික වහල්කමේ තබාගෙන සිටි ආකාරය එක වින්දිත දෙමළ කාන්තාවක් විස්තර කර තිබේ. ඇය ඇතුළු තවත් තරුණ දෙමළ කාන්තාවන් රඳවා තබාගෙන සිටි එක් හමුදා කඳවුරකට වැඩ ඇරී රාත්‍රියේ පැමිණෙන සොල්දාදුවෝ කාන්තාවන් තෝරාගෙන පිටතට ගෙනගොස් දූෂණය කර ඇත. ගැබ්බර වනු වැලැක්වීම පිණිස ඔවුන්ට උපත් පාලන බෙහෙත් දී තිබේ.

හමුදා බුද්ධි අංශය, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාසය සහ විශේෂ බුද්ධි සේවාව ඇතුළු රාජපක්ෂ මහතාගේ අණසක යටතේ පැවති වගකිවයුතු විවිධ රජයේ ආයතන පැමිණිල්ල විසින් හඳුනාගෙන තිබේ. තමන්ට වධබන්ධන පැමිණවීමට සෘජුවම සම්බන්ධ බවට චෝදනා ලබන ආරක්ෂක නිලධාරීන් ද පැමිණිලිකරුවන් විසින් නම් කර ඇත. ඇතැමුන් රාජපක්ෂ මහතාගෙන් සෘජුවම උපදෙස් ලද බවටද චෝදනා කෙරේ. වධහිංසා පැමිණවූ බවට චෝදනා ලබන තවමත් පොලිසියේ හා යුද හමුදාවේ රාජකාරියේ නියුතු අපරාධකරුවන් කිහිප දෙනකුම අධිකරණ ලියැවිලි මගින් නම් කොට තිබේ[4].

*"මේ නඩුකරයට සම්බන්ධ අයට හෝ ඔවුන්ගේ පවුල්වලට හෝ විරුද්ධව දැන් පලිගැනීම් සිදුකෙරේ නම්, ඊට වගකිව යුත්තේ කවුද යන්න සක්සුදක් සේ පැහැදිලි වනු ඇත,"* යි යැස්මින් සූකා අනතුරු ඇඟවූවාය. *"ජාත්‍යන්තර ප්‍රජාව බලා හිඳිනු ඇත."* අප්‍රේල් මාසයේ නඩුව පැවරූ විගසම රාජපක්ෂ මහතා නියෝජනය කරන බව කියාගත් පුද්ගලයන්ට විරුද්ධව අත්හිටුවා වැළකී සිටීමේ දැනුම්දීමක් අධිකරණයේ ගොනු කරන්නට සමාදනම් මහතාගේ නීතිඥවරුන්ට සිදුවිය[5].

*"මේ නඩුකරයේ පැමිණිලිකාර රෝයි සමාදනම් සහ නිර්නාමික ගැහැනුන් සහ මිනිසුන් දසදෙනා ඉදිරියට පැමිණීමෙන් දක්වන ලද අතිමහත් ධෛර්ය සම්පන්න භාවය සම්බන්ධයෙන් සකල ශ්‍රී ලංකාවාසීන් ඔවුන්ට මහත්සේ ණයගැතිය,"* යි හවුස්ෆෙල්ඩ් නීතිඥ සමාගමේ සභාපති මයිකල් හවුස්ෆෙල්ඩ් පැවසීය. *"ඔවුන් අපගේ ඉමහත්*

---

[3] http://www.itjpsl.com/assets/press/Rajapaksa-First-Amended-Complaint-Docket-No-35-6.26.19.pdf
[4] http://www.itjpsl.com/assets/press/ECF-No.-0066-3-Exhibit-B-to-Sooka-Decl.pdf
[5] http://www.itjpsl.com/assets/press/Dkt.-024_Plaintiffs-Ex-Parte-App-and-Memo.pdf
http://www.itjpsl.com/assets/press/Dkt.-024-1-Sweeney-Decl.-ISO-Ex-Parte-Application.pdf

*ගෞරවයට පාත්‍රවන අතර ඔවුන් වෙනුවෙන් මතුයම් දවසක යුක්තිය ඉටුකර දීමට අපේක්ෂා කරමු".*

## කර්තෘවරුන්ට සටහනක්

### රෝයි සමාදනම් පිළිබඳව

එවක ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂට සෘජුවම වාර්තා කළ ශ්‍රී ලංකා පොලිසිය විසින් අසත්‍ය චෝදනා යටතේ කැනඩා පුරවැසි රෝයි සමාදනම් 2007 සැප්තැම්බරයේ කොළඹදී අත් අඩංගුවට ගන්නා ලදී. සිය බිරිඳ විවාහ කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවට ගොස් සිටියදී අවුරුදු තුනක් සිරගත කොට සිටි සමාදනම් මහතා නීතිඥ වරයකුට මුණ ගැස්වීම හෝ විනිසුරුවරයකු ඉදිරියට පැමිණවීම හෝ දිගින් දිගටම ප්‍රතික්ෂේප වී තිබේ. රාජපක්ෂ මහතාගේ විධානය යටතේ සිටි රැකවලුන් සමාදනම් මහතාට වධ දී, ඔහුගේ බිරිඳ හා දරුවා දූෂණය කොට මරා දමන බවට තර්ජනය කර, වෙනත් සිරකරුවන්ට විදුලි සැර වද්දනු බලා සිටීමට ඔහුට සලස්වා තිබේ. 2010 අගෝස්තුවේ ඔහු නිදහස් කර යවා ඇත්තේ ව්‍යාජ පාපෝච්චාරණයකට අත්සන් ගැනීමෙන් අනතුරුවය.

නිදහස ලැබීමෙන් පසු සමාදනම් මහතා ප්‍රසිද්ධ උද්ඝෝෂකයකු බවට පත්විය. තමන් විදි දුක් ගැහැට පිළිබඳව ඔහු 2011 දී කැනඩා පාර්ලිමේන්තුව හමුවේ කරුණු දක්වා සිටියේය. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව් හමුවේ පවරන ලද නඩුවකින් සමාදනම් මහතා ජයගත් නුමුත් එමගින් නියම කෙරුණු වන්දිය ශ්‍රී ලංකාවේ රජය තවමත් ගෙවා නැත.

### හවුස්ෆෙල්ඩ් පිළිබඳව

හවුස්ෆෙල්ඩ් යනු බර්ලින්, බොස්ටන්, බ්‍රසල්ස්, ඩසල්ඩෝෆ්, ලන්ඩන්, ස්ටොක්හෝම්, නිව්යෝර්ක්, පැරිස්, ෆිලඩෙල්ෆියා, සැන් ෆ්‍රැන්සිස්කෝ සහ වොෂිංටන් ඩීසී හි කාර්යාල සහිත ප්‍රධාන පෙළේ ජාත්‍යන්තර නීති සමාගමකි. එය සංකීර්ණ නඩුකර සම්බන්ධ විශේෂඥ දැනුමක් ඇති ආයතනයකි. එහිදී, ප්‍රතිහාර/තරගකාරිත්වය, මූල්‍ය සේවා, ක්‍රීඩා සහ විනෝද කර්මාන්ත, පාරිසරික, සමූහ අලාභ, පාරිභෝගික ආරක්ෂාව සහ බොහෝ දුරට ජාත්‍යන්තර පරිමාණයේ මානව හිමිකම් කරුණු ආදිය විශේෂිතය. ප්‍රතිහාර/තරගකාරිත්ව නීතිය පුද්ගලිකව බලාත්මක කිරීම සම්බන්ධයෙන් Legal 500 සහ Chambers & Partners විසින් එක්සත් ජනපදයේ සහ යුරෝපයේ ඉහළම තලයේ ශ්‍රේණිගත කර ඇති එකම සමාගම හවුස්ෆෙල්ඩ් වෙයි.

### ITJP පිළිබඳව

සත්‍යය හා යුක්තිය සඳහා වන ජාත්‍යන්තර ව්‍යාපෘතිය (ITJP) දකුණු අප්‍රිකානු සංක්‍රාන්ති යුක්ති විශේෂඥ යැස්මින් සූකා විසින් මෙහෙයවනු ලබන රාජ්‍ය නොවන සංවිධානයකි. ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධයේ අවසාන අදියර සහ පශ්චාත් යුද කාල පරිච්ඡේදය ට අදාළ සාක්ෂිවාචක සහ තොරතුරු ඇතුලත් විශාලතම ලේඛනාගාරය ඇත්තේ ඔවුන් සතුවය. යුද්ධයේ සහ වධහිංසා පැමිණවීමේ භූමිකාව සම්බන්ධයෙන් චෝදනා එල්ලවන ශ්‍රී ලංකාවේ විශ්‍රාමික හමුදපති වරයකු චිලී, බ්‍රසීලය, පෙරු සහ කොලොම්බියාවේ තානාපති වරයකු ලෙස කටයුතු කරද්දී ITJP විසින් ඔහුට විරුද්ධව 2017 අගෝස්තුවේදී සර්වලෝක අධිකරණ බලය යටතේ නඩු 4 ක් පවරන ලදී.